# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරනලදී.

අංක. 9,528—1946ක්වූ මාර්තු මස 8 වෙනි දිනවූ සිකුරාද.

Part IV.—හතරවෙනි කාණ්ඩය.


## උපාංග නීති.

### වන්දනා ගමන් පිළිබඳ ආඥාපණත.

### සන්තානා මඞ්ගල්‍යය සම්බන්ධ ව්‍යවස්ථා.

1946 මාර්තු මස සන්තානා මඞ්ගල්‍යය සඳහා තලවිල්ලුවට සිරිත්පරිදි කෙරෙන වන්දනාගමනය උදෙසා, (133වෙනි පරිච්ඡේදය වූ) වන්දනාගමන් ආඥාපණතෙහි 2වෙනි වගන්තියෙන් ලත් බලය ප්‍රකාර, ලංකාණ්ඩුකාරතුමා වන හැන්රි මොන්ක් මේසන් මුවර් නමැති මම, මෙම දැන්වීමෙහි පහත දැක්වෙන ව්‍යවස්ථා පනවමි.

හෙන්රි මුවර්,
ආණ්ඩුකාරතුමා.

මෙම 1946ක්වූ මාර්තු මස 1වෙනි දින කොළඹදීය.

### ව්‍යවස්ථා.

1. මෙම ව්‍යවස්ථාවල "ලැගුම්භූමිය" යන්නෙන් හඟවන්නේ මීට යාකර තිබෙන උප ලේඛනයෙහි දක්වෙන සීමාතුළ පිහිටි භූමිභාගයයි. "උප දිසාපතිතුමා" යන්නෙන් හඟවන්නේ පුත්තලම් හලාවත දෙපළාතේ උප දිසාපතිතුමාය.

2. උප දිසාපතිතුමාගේ විශේෂ හෝ සාමාන්‍ය අවසරයකින් ලැගුම්භූමිය තුළ ලැගුම්ගැනීම සහතිකකරනලද කිසිම ස්ථානයක කිසිවකු විසින් ලැගුම්ගතයුතු නොවේ.

3. ශරීරකෘත්‍ය සඳහා උප දිසාපතිතුමා විසින් හෝ එතුමාගේ අනුමතය ඇතුව වෙන්කර තිබෙන ස්ථානවල හැර ලැගුම්භූමිය තුළ අන්කිසි තැනක කිසිවකු විසින් මලමූත්‍ර නොකළ යුතුයි.

4. උප දිසාපතිතුමා විසින් හෝ එතුමාගේ අනුමතය ඇතුව ඒ සඳහා වෙන්කර තිබෙන ස්ථානවල හෝ භාජනවල මිස ලැගුම්භූමියේ වෙන තැනක කිසිවකු විසින් කුණුකසල රොඩු ආදිය හෝ කුණුවතුර නොදැමිය යුතුයි.

5. (a) මැරීම පිණිස ලැගුම්භූමියට ගෙනෙනලද ගවයන් හා උප දිසාපතිතුමාගේ විශේෂ හෝ සාමාන්‍ය අවසරයකින් එබඳු භූමියෙහි තබාගැනීමට අවසර දෙනලද ගවයන් හැර අන්කිසි ගවයකු ලැගුම්භූමියෙහි තබා නොගත යුතුයි.

(b) උප දිසාපතිතුමා විසින් ගවගාලක් වශයෙන් විශේෂයෙන් නියමකරනලද තැනක හෝ ඒ කටයුත්තට යෙදීම පිණිස එතුමා විසින් අනුමතකරනලද තැනක හැර ලැගුම්භූමියට සමීපව වෙන තැනක ගවයින් නොබැඳිය යුතුයි.

(c) ගවයින් භාරව සිටින අය උන්ගේ ගොම ඊට නියමකර තිබෙන අසල ස්ථානයකට ඉවත්කරවා තමාගේ ගවයන් ඉන්නාතැන සෑමවිටම පවිත්‍රකර තබාගත යුතුයි.

6. ආහාර පිණිස සාදා ලැගුම්භූමිය තුළ විකුණනු ලබන සියලුම කෑම ජාති (a) පිරිසිදු කබඩ්සිවල නොහොත් රෙදිවල දවටා හෝ ඉන් වසා හෝ, (b) වසනලද වීදුරු පෙට්ටිවල දමා හෝ (c) ලැගුම්භූමිය භාර සනීපාරක්ෂක නිලධාරීතුමා විසින් හෝ වෛද්‍ය නිලධාරීතුමා විසින් මැනවැයි පිළිගන්නාලද වෙනත් පියන් සහිත භාජනවල දමා හෝ මැස්සන්ගෙන් හා දූවිල්ලෙන් ආරක්ෂාකළ යුතුයි.

7. බෝවෙන රෝගයකින් පෙළෙන කෙනකුට හෝ ලැගුම්භූමියේ පවිත්‍රකමට බාධාවක්ව සිටියහැකි කෙනකුට ලැගුම්භූමියට ඇතුල්වන්නට ඉඩනොදිය යුතුයි.

8. මඞ්ගල්‍යය පවත්වන කාලයතුළදී ලැගුම්භූමියෙහි යම් වසංගත රෝගයක් හටගැණුනිනම් වන්දනාකාරයින්ට වන්දනාභූමියෙන් පිටවී යන්නටද පිටවී යන මාර්ග සහ ඔවුන් ගෙනයන ක්‍රම නියමකරන්නටද උප දිසාපතිතුමාට පුළුවන.

9. (a) ලැගුම්භූමිය තුළ බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන සෑම අයද, (b) ඔහු එසේ පෙළෙන බව දැන දැනම ඔහු සමග වාසයකරන සෑම අයද ඒ රෝගියා ගැන ලැගුම්භූමිය භාරව සිටින සනීපාරක්ෂක නිලධාරීතුමාට හෝ වෛද්‍ය නිලධාරීතුමාට දැනුම්දෙන්නට ඕනෑය.

10. ලැගුම්භූමිය තුළ යම් වැවක් හෝ ළිඳක් යම් නියම කටයුත්තක් සඳහා වෙන්කොට ඒ බවට ඒ ස්ථානයෙහි දැන්වීමක් ගසා තිබෙනවිට එම වැව හෝ ළිඳ එය වෙන්කොට තබා තිබෙන කටයුත්ත සඳහා හැර අන්කිසි දෙයකට කිසිවකු විසින් නොයෙදිය යුතුයි.

11. සාප්පුවක් හෝ සිසිල්බීම සාදන ස්ථානයක් හෝ තේපැන් සාලාවක් හෝ කෝපි කඩයක් හෝ බත්කඩයක් හෝ ශාලක් තැබීම පිණිස උප දිසාපතිතුමාගෙන් කලින් බලපත්‍රයක් ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ එබඳු ස්ථානයක් තබාගතයුතු නොවේ. බලපත්‍රය නොමිලයේ දෙනු ලැබේ.

12. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියේ මහ වීදියෙහි හෝ වෙනයම් වීදියක අස්ථිර ලෙසේ යම් කඩයක් තැබීම හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දික්කිරීම යුතුනොවේ.

13. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ හෝ එහි මායිම්වල සිට හැතැප්මක් ඇතුළත හෝ ගිනිකෙළි හෝ තුවක්කු පත්තු නොකළ යුතුයි.

14. උප දිසාපතිතුමා විසින් හෝ එතුමාගේ අනුමතය ඇතුව ඒ සඳහා නියමකර තිබෙන ස්ථානයක හැර ලැගුම්භූමිය තුළ කිසිවකු විසින් සතකු නොමැරිය යුතුයි. තවද එබඳු ස්ථානයෙහි සතකු මරන සෑම අයම එය පවිත්‍රව තබාගැනීම ගැන වගකිය යුතුවේ.

15. තලවිලට ඇතුල්වෙන රථවාහන සියල්ලම පාලකුඩා පාරෙන් ගොස් ඒතාලේ පාරෙන් ආපසු ආ යුතුයි.

### උප ලේඛනය.

#### තලවිල ලැගුම්භූමියේ සීමා.

උතුරට තලවිල ඕබ්බිසි; දකුණට ඒතාලේ-තලවිල සහ තේලිකුඩා-තලවිල පාරවල්වල එරුම්බුකුඹල් හන්දියේ සිට කෙළින් බස්නාහිර අතට මුහුදට යන පාර; නැගෙනහිරට පන්ඩාරම්, කරුක්කුවච්චම් සහ පෙරියතොඩ්ඩම් පාරවල්; බස්නාහිරට මුහුද.

#### ඒතාලේ ලැගුම්භූමියේ සීමා.

උතුරට තෙලිකුඩාවේ සිට වැලිකන්ද දක්වා බස්නාහිරට යන පාර; නැගෙනහිරට කලපුව; දකුණට සුරුවි ඇළ; බස්නාහිරට වැලිකන්ද.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

Colombo No. 109—බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වන 1946ක්වූ අප්‍රේල් මස 25වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පස්වරු 2.30ට මීරිගම තානායමේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් වෙන අන්දමකින් නිත්‍යකරට දෙනවා ඇත. බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම්කෝරළේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 38ක්.

මුල් සිතියමේ අංක. 20,123. ගම—ඉරගොඩ, යටිගහපත්තුව.

| අංක. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | මුරුතගහකුඹුරපිල්ලෑව. | රණනායකපතිරන්නැහේලාගේ පුංචි නෝනා විසින් අල්ලාගත් කොටස | අවුරුදු 44ක් වයසැති පොල්ගස් 4ක් තිබේ | 0 0 24 | 200 |

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නෝ. | අන්දම. | මහන. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 | රදලවෙච්චිගලබොඩවත්ත | හපුගලආරච්චිගේ චාර්ලිස් අප්පුහාමි, එම සින්චිනෝනා සහ එම පුංචි නෝනා විසින් අල්ලාගත් කොටස | අවුරුදු 18 සිට 42 දක්වා වයසැති පොල්ගස් තිබේ | 0 | 2 | 21 | 200 |
| 4 | එම .. | හපුගලආරච්චිගේ පොඩිඅප්පුහාමි විසින් අල්ලාගත් කොටස | අවුරුදු 20 සිට 29 දක්වා වයසැති පොල්ගස් තිබේ | 0 | 0 | 15 | 200 |
| **මූල් සිතියමේ නො. 20,134. ගම බෝතලේ පහලගම, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | මීජගම්කන්ද .. | — | .. ඇලට අත්හැර තිබේ .. | 0 | 1 | 5 | —* |
| 4 | එම .. | — | .. පාරකට අත්හැර තිබේ .. | 0 | 0 | 8 | —* |
| **මූල් සිතියමේ නො. 20,241. ගම—මඩබාවිට, උඩුගහපත්තුව** | | | | | | | |
| 1 | මිලිකුලකන්ද .. | හෙලේආරච්චිගේ සෙදිරිස්සිංඤෝ විසින් අල්ලාගත් කොටස | වයස අවුරුදු 20ක් ඇති පොල් ගස් තිබේ | 0 | 1 | 3 | 200 |
| **මූල් සිතියමේ නො. 20,242.** | | | | | | | |
| 1 | මිලිකුලකන්ද නොහොත් දෙලපල්ලේවත්ත | එච්. ජ්. නෝරිස්සිංඤෝ විසින් අල්ලාගත් කොටස | අවුරුදු 18ක් වයසැති පොල් ගස් සහ අවුරුදු 28ක් වයසැති රබර්ගස් තිබේ | 1 | 3 | 21 | 200 |
| **මූල් සිතියමේ නො. 20,247. ගම—කොටදෙනියාව, යටිගහපත්තුව.** | | | | | | | |
| 1 | ඇලිවල .. | — | .. කුඹුරකට අත්හැර තිබේ .. | 0 | 3 | 5 | —* |
| **මූල් සිතියමේ නො. 20,283. ගම—මඩබාවිට, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | මිලිකුලකන්ද .. | — | .. ඇලට අත්හැර තිබේ .. | 0 | 1 | 1 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 21. ගම—හපුගහගෙදර, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | කෝපිවත්තෙමිනිපිටිය .. | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ .. | 0 | 2 | 3 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 67. ගම—මිදල්විල, උඩුගහපත්තුව.** | | | | | | | |
| 6 | දඹුවේමුකලාන නොහොත් දඹුවේකැලේ | — | .. කමතට අත්හැර තිබේ .. | 0 | 0 | 13 | —* |
| 7 | එම .. | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ .. | 0 | 2 | 0 | —* |
| 8 | එම .. | — | .. කමතට අත්හැර තිබේ .. | 0 | 0 | 20 | —* |
| 10 | දඹුවේමිනිපිටිය .. | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ . | 0 | 1 | 15 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 80. ගම—කැබෙල්ලවිට, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | ගල්ලිදකන්ද .. | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ . | 1 | 0 | 15 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 82. ගම—හේනෙපොල, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | දංගහකුඹුරේමිනිපිට්ටනිය | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ .. | 0 | 3 | 36 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 97. ගම—මීරිගම, උඩුගහපත්තුව.** | | | | | | | |
| 3 | මීජගම්කන්ද .. | — | .. අඩිපාරට අත්හැර තිබේ .. | 0 | 1 | 6 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 98. ගම—කල්එලිය පල්ලේවෙල, යටිගහපත්තුව.** | | | | | | | |
| 1 | කොටකන්ද .. | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ . | 0 | 1 | 18 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 107. ගම—පොහොන්නාරුව, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | දිඇලකන්ද .. | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ . | 0 | 3 | 0 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 121. ගම—තලගම, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | ඇලෝමිට .. | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ . | 1 | 1 | 28 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 131. ගම—වල්බොතලේ, උඩුගහපත්තුව.** | | | | | | | |
| 6 | කවුවකැලේ නොහොත් කන්දඋඩකැලේ | — | .. පාරට අත්හැර තිබේ .. | 0 | 0 | 5 | — |
| **මූල් සිතියමේ නො. ජ් 132.** | | | | | | | |
| 2 | කහවගහකුඹුරපිල්ලෑව .. | කොළඹ රෙඩිනි විදියේ පදිංචි චාර්ලිස් සිරිසේන සේනානායක විසින් අල්ලාගත් කොටස | අවුරුදු 3ක් වයසැති පොල්ගස් 13ක් තිබේ | 0 | 1 | 8 | 200 |
| **මූල් සිතියමේ නො. ජ් 146. ගම—පඹුණුවත්ත, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | දිද්දෙනිමුල්ලේමිනිපිටිය. | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ .. | 0 | 3 | 25 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 153. ගම—මඩබාවිට, උඩුගහපත්තුව.** | | | | | | | |
| 3 | මිලිකුලකන්ද .. | — | .. ඇලට අත්හැර තිබේ .. | 0 | 1 | 2 | —* |
| 5 | එම .. | — | .. පාරට අත්හැර තිබේ .. | 0 | 0 | 15 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 300. ගම—ගොඩකලාන, උඩුගහපත්තුව.** | | | | | | | |
| 3 | කිතුලේකන්ද, බූන්ග්වල කැලේ | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ | 1 | 0 | 18 | —* |
| 4 | බූන්ග්වලකැලේ නොහොත් කිතුලේකන්ද | — | .. අඩිපාරට අත්හැර තිබේ .. | 0 | 0 | 29 | —* |
| 9 | එම .. | — | .. කරත්තපාරට අත්හැර තිබේ | 0 | 0 | 9 | —* |
| 11 | එම .. | — | .. කරත්තපාරට ඉතුරුකරතිබේ | 0 | 0 | 16 | —* |
| 14 | එම .. | — | .. අඩිපාරට අත්හැර තිබේ .. | 0 | 0 | 22 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 556. ගම—වෙවැල්දෙනිය ඉහලගම, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | හෙලේකැලේ .. | — | .. අඩිපාරට අත්හැර තිබේ .. | 0 | 0 | 33·6 | —* |
| 2 | එම .. | — | .. අඩිපාරට ඉතුරුකර තිබේ .. | 0 | 0 | 6·2 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 861. ගම—තුනගේදෙනිය, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | දෙමටකුඹුර .. | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ | 0 | 0 | 5 | —* |
| 2 | දෙල්ගහලන්ද .. | — | .. එම .. | 2 | 1 | 34 | —* |
| 3 | හොරගොල්ලේවත්ත, දෙල්ගහලන්ද | — | .. එම .. | 0 | 0 | 6 | —* |
| **මූල් සිතියමේ නො. ජ් 1,414. ගම—දෙල්වල, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | ඌරුමුල්ලේපිටිය .. | — | .. මිනිපිට්ටනියට අත්හැර තිබේ | 0 | 1 | 37 | —* |
| 2 | ඌරුමුල්ලේකැලේ .. | — | .. එම .. | 0 | 1 | 2 | —* |
| **සිතියමේ නො. F. S. P. P. 66. ගම—හලුගම, උඩුගහපත්තුව.** | | | | | | | |
| 1 | කොස්ගහදෙනියවත්ත .. | කිදිවල පදිංචි අබයගුණවර්ධන කුසුමාවතී විසින් අල්ලාගත් කොටස | වයස අවුරුදු 32ක් ඇති පොල් ගසක් තිබේ | 0 | 0 | 11 | 200 |

* වික්‍රණනු නොලැබේ.

මෙම ඉඩම් සම්බන්ධව උවමනාකරණ විස්තර බස්නාහිර පලාතේ දිසාපතිතුමාගෙන්ද, ඒ පිළිබඳ ප්ලෑන්ස් සර්වේයර් ජනරල් තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

එම 1946ක්වූ මාර්තු මස 2වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ජී. ඇල්. ඩී. ඩේවිඩ්සන්,
අතිරේක ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ගෙරදෙකිපිටිය පාරේ හන්දිය පළල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පළාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මම අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 1,787. ගම—වේරගොඩ හෝ සේදවත්ත.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත; අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | වේරගොඩවෙල නොහොත් ශාලවත්ත, සේදවත්ත පාරේ වරිපනම් නො. 6 කොටසක් | අවුරුදු 15 කඳුරුගහක් ඇති කණකොල ඉඩම | ජේ. බී. මැන්ඩිස් නෝනා, බාලි පාර, කොළඹ | 0 0 0·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ මාර්තු මස 29වෙනි දින පෙරවරු 10.30ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ මාර්තු මස 2වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඒ. ඇල්. බී. පර්ඩිනන්ඩ්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වම්හ.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කළුතර දිස්ත්‍රික්කයේ වලානේ "විද්‍යාල පාර" පළල්කිරීම සඳහා මෙහි පහත සඳහන් වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි කාණ්ඩයේ (203 වෙනි පරිච්ඡේදයේ) කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පළාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 1,686. ගම—වලාන (කොටසක්).

| නො. | ඉඩමේ නම. | අන්දම. | මහත; අ. රූ. ප. |
|---|---|---|---|
| 1 | පරණගුරුගෙවත්ත, වරිපනම් නො. 34වේ කොටසක් (වලාන පාර) | වලානේ පදිංචි ජේ. ඒ. ප්‍රනාන්දු විසින් අයිතිකම්කියනුලබන අවුරුදු 50ක් වයස ඇති පොල්ගසක්ද, අවුරුදු 2ක් වයස ඇති අඹගසක් සහ දොඩම් ගසක් ඇති වත්ත | 0 0 0·61 |
| 2 | කෝන්ගහවත්ත, වරිපනම් නො. 30වේ කොටසක් (වලාන පාර) | වලානේ පදිංචි කේ. ඩී. ලිවේරිස් අප්පුහාමි හෝනාමහත්මයා විසින් අයිතිකම්කියනුලබන අවුරුදු 50ක් වයස් ඇති පොල්ගස් 3ක් ඇති වත්ත | 0 0 1 |
| 3 | කෝන්ගහවත්ත, වරිපනම් නො. 34/3 කොටසක් (වලාන පාර) | වලානේ පදිංචි ඩබ්ලිව්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් අයිතිකම්කියනුලබන අවුරුදු 15ක් වයස ඇති පොල්ගසක් ඇති වත්ත | 0 0 1·11 |
| 4 | කෝන්ගහවත්ත, වරිපනම් නො. 34/4 කොටසක් (වලාන පාර) | වලානේ පදිංචි ඇම්. ඇස්. කුරේ, ඇම්. ජේ. ප්‍රනාන්දු, ඇන්. ඒ. ප්‍රනාන්දු, ඇම්. ආර්. ප්‍රනාන්දු සහ එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු යන අයවලුන් විසින් අයිතිකම්කියනුලබන අවුරුදු 20ක් වයස ඇති පොල්ගස 4ක් සහ පුවක්ගස් එකක් ඇති වත්ත | 0 0 2·91 |
| 5 | කෝන්ගහවත්ත නොහොත් අඹගහවත්ත, වරිපනම් නො. 32/1 කොටසක් (වලාන පාර) | වලානේ පදිංචි ඇස්. ඇම්. ප්‍රනාන්දු විසින් අයිතිකම්කියනුලබන (වගාවක් නැති) වත්ත | 0 0 0·12 |
| 6 | කෝන්ගහවත්ත, වරිපනම් නො. 30වේ කොටසක් (වලාන පාර) | වලානේ පදිංචි කේ. ඩී. ලිවේරිස් අප්පුහාමි හෝනාමහත්මයා විසින් අයිතිකම්කියනුලබන අවුරුදු 50ක් වයස ඇති පොල්ගස් 8ක්ද, අවුරුදු 10–20 වයස ඇති පොල්ගස් 5ක්ද, පුවක්ගසක් සහ දවටගසක්ද ඇති වත්ත | 0 0 7·19 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ අප්‍රේල් මස 26වෙනි දින පෙරවරු 9යේ කනිසමට පානදුරේ ආදායම් පාලක නිලධාරිතැනගේ කාර්යසීලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවම ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවාට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ මාර්තු මස 5වෙනි දින
කළුතර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගුණරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කඩුගන්නාවට සම්බද ආරෝග්‍යශාලාවක් හැදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ බලයපිට පළාත් පාලක විධායක මණ්ඩලයෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ. ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,094. ගම—කොවලිගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගෙදරකුඹුරේවත්ත නොහොත් කැටපිටියේහේන | හේන් ඉඩම .. | කොවලිගොඩ ජයසිංහ කෝරාලා .. | 0 0 37·1 |
| 2 | දෙහිඹදෙපැලේවත්ත නොහොත් කැටපිටියේහේන | එම .. | රංබණ්ඩා වීරසේකර, අබේරත්න වීරසේකර සහ හීන්බන්ඩා වීරසේකර, මැනික්දිවෙල | 0 1 19·3 |
| 3 | එම .. | එම .. | ජයමංගල රත්වත්ත සිරිසෝම, කඩුගන්නාව, ජයමංගල එම්. අබේතුංග, ජයමංගල ඒ. සමරසේකර, එළදළුවත්ත, බදුල්ල | 0 1 18·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ අප්‍රේල් මස 5වෙනි දින පෙරවරු 10.30ට කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ මාර්තු මස 4වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඒ. ඇස්. කොහොඹන්-වික්‍රම,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

ආණ්ඩුවේ කාවශ්‍යත්තකාව, එනම්:—තුන්ඩුවේ ආණ්ඩුවේ සවභාෂා මිශ්‍ර පාඨශාලාවක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන් වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "(Cap. 203) ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන සංශෝධනවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ කැමැත්ත පිට පලාත් ආණ්ඩු කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

මුල් සිතියමේ නො. A 989. ගම—තුන්ඩුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත; අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගෙහකට්ටියවත්ත .. | අවුරුදු 15–35 පමණ වයස ඇති පොල්ගස් 15ද, අවුරුදු 5 පමණ වයස ඇති දෙහිගස් 1ද, මැටියෙන් තනනලද අතු සෙවිලිකරපු වැසිකිලියක්ද ඇති ඉඩම වේ | තුන්ඩුව, හබුරුගල පදිංචි තුන්ඩුව වැප්පෙප්වාරි බයස් සහ ගක්වාරි අමාරිස් ප්‍රනාන්දු | 0 0 11·5 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ අප්‍රේල් මස 5වෙනි දින පෙරවරු 11ගේ කාලසමට බෙන්තොට තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1946ක්වූ පෙබරවාරි මස 21වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ජී. වී. පී. සමරසින්හ,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

ආණ්ඩුවේ කාවශ්‍යත්තකාව එනම්:—කලේගාන ආණ්ඩුවේ මිශ්‍ර පාඨශාලාවක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "(Cap. 203) ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන සංශෝධනවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ කැමැත්ත පිට පලාත් ආණ්ඩු කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

මුල් සිතියමේ නො. A 933. ගම—කුඹල්වැල්ල (ගාල්ලේ නාගරික සීමාව තුල).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 5 | මැබොක්ක, බෝපෙ පාරේ වරිපනම් නො. 192 කොටස, නො. 13 වෝඩ් | අවුරුදු 35ක් වන පොල්ගස් 2ද, අවුරුදු 12ක් වන පොල්ගස් 6ක්ද, අවුරුදු 15ක් වන දෙල්ගස් 1ක්ද, අවුරුදු 6ක් වන පුවක්ගස් 6ක්ද ඇති පොල් ඉඩම | නැසීගිය ගාල්ලේ බෝපෙ පදිංචි ඩබ්ලිව්. බී. හැමුවෙල්ගේ උරුමක්කාරයෝ | 0 0 6 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ අප්‍රේල් මස 8වෙනි දින පෙරවරු 10ගේ කාලසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මුල් සිතියමේ නො. A 933 දරන පිඹුරේ ලොට් නො. 5 සඳහා වම් 1945ක්වූ අගෝස්තු මස 10වෙනි දින අංක 9,447 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකල දැන්වීම මෙයින් අවලංගුකරනු ලැබේ.

වම් 1946ක්වූ පෙබරවාරි මස 28වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ජී. වී. පී සමරසින්හ,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වම් 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කාවශ්‍යත්තකාව, එනම්:—වැල්ලවාය ගම්පහේ අලුත් පාඨශාලාවක් හැදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වම් 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන සංශෝධනවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේ ගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

නො. 336 දරණ අන්තිම ගම් සිතියමේ නො. 1 දරණ අතිරේඛය. ගම—බුලත්වැල්ගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 151 | කිරිබරුවේහේන .. | හේන, තාවකාලික ගොඩනැගිලි 3ක් සහ කොසෙල්පඳුරු 3ක්ද තිබේ | මිරිස්වත්තේ ඇන්. එච්. ද සිල්වා මහතා, කොස්ලන්ද | 0 3 37·5 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ අප්‍රේල් මස 15වෙනි දින පෙරවරු 10ගේ කාලසමට බදුළු කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1946ක්වූ පෙබරවාරි මස 26වෙනි දින බදුළු කච්චේරියේදීය.

ඇන්. මාසිත්කෙයි ඉබෙයිකබර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## ඉඩම් සශ්‍රිකකිරීමේ දැන්වීම.

### දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

මෙහි පහත විස්තර දැක්වෙන ආණ්ඩුවේ ඉඩම සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස වැලිමඩ ගම්සභාවේදී වම් 1946ක්වූ මාර්තු මස 30වෙනි දින පූ. භා. 10ට 1935ගේ අංක 19 දරණ ඉඩම් සශ්‍රිකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් ලඟට පලාතේ බදුල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති හැම අයකු විසින්ම ඉඩම කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇත හොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

ඇල්. ඇල්. හන්ටර්,
අතිරේක ඉඩම් කොමසාරිස්තුමා,

වම් 1946ක්වූ පෙබරවාරි මස 28වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

## දීමට යන ඉඩම්වල විස්තර.

### ප්ලෑනේ අංකය—අන්තිම ගම් සිතියමේ නො. 39.

### ගම—කටුගල්ල.

| කැබෙල්ලේ අංකය. | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය. අ. රූ. ප. |
|---|---|---|
| 1D1 .. | කටුගල්ලේ උඩහගෙදර කාල්ලදූරයාලාගේ නිඳුනා .. | 0 3 39 |
| 1D .. | කටුගල්ලේ ගාල්ලදූරයාලාගේ විඳුනෙ .. .. | 0 3 26 |
| 1AC .. | එම මුතිසිරියා .. .. | 0 3 26 |
| 1V .. | එම හාඩුවත්තේගෙදර මද්දිලියා | 1 0 1 |
| 1W .. | දරගල ඇල්ලේවත්තේගෙදර කන් සොදිදූරයාලාගේ උක්කුහකනා . | 0 3 25 |
| 1Z .. | කටුගල්ලේ හාඩුවත්තේගෙදර ලූසිහාමි .. .. | 1 0 3 |
| 1Q සහ 1AG | එම ගාල්ලදූරයාලාගේ නිඳුනා .. | 0 3 26 |
| 1AI .. | රතමේ වක්කුඹුරේගෙදර බිංගිරි .. | 1 0 8 |
| 1AK .. | කටුගල්ලේ කපුවත්තේගෙදර ගාලා දූරයාලාගේ නිඳුනා .. | 1 0 3 |

එසේ නැත්නම් කිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්ත වරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පු කරන්ට ඕනෑය. එක එක ඉඩමට වෙන් වෙන්ව ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

3. යම් ඉල්ලුම්පත්‍රයක් භාරගැනීමේ හෝ නොගැනීමේ බලය ඒජන්තතුමා වෙත තබාගන්නාලදී.

4. ඒජන්තතුමා විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදලෙන් 1/5 කොටසක් එවෙලේම ගෙවන්ට ඕනෑය. ඉතුරු මුදල් සම කොටස්වලින් 1947ත්, 1948වේ, 1949යේ, 1950යේ ජනවාරි 1වෙනිදසින් ප්‍රථම ගෙවන්ට ඕනෑය.

5. කැලෑවට යන්ටනොදී ඉඩම හොඳ අන්දමින් තබාගැනීමට බදුකාරයා වගකිය යුතුය.

6. උචිතාකාරණ කානු සහ වලවල් ආදිය කපා ඉඩමේ පස් සෝදායාම වැලැක්විය යුතුය.

7. බද්ද අවසානවූ විහාම හෝ අවලංගුකලවිට බදුකාරයා වගාවට අනතුරුනොකර ඉඩම නිරවුල්ව භාරදිය යුතුයි.

8. කුපන්දීම සඳහා කාරනා රබර්පාලකතුමාගෙන් දැනගත යුතුයි.

9. රබර් පාලකතුමා විසින් නියමකළහොත් ඉඩම් පරීක්ෂා කිරීමට සහ තක්සේරුකිරීමට යන මුදලක් බදුකාරයා විසින් ගෙවිය යුතුය.

10. වැඩිදුර කාරණා සබරගමු පලාතේ ඒජන්තතුමාගෙන් ලබාගත හැක.

ඩී. වනසුන්දර,
සබරගමු පලාතේ මහා ඒජන්තතුමා වෙනුවට.

මේ 1946ක්වූ මාර්තු මස 4වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

කුකුළුකෝරලය.

අයගම—F. V. P. 42.

| රෙජිස්ටර් නො. | නො. | ඉඩම්වල විස්තර. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|
| 1 | 193S3R245 | .. 832K .. | .. 3 0 14 |
| | | ගවරගිරිය—F. V. P. 41. | |
| 2 | 192S3R212 | .. 74C (කොටසක්) | .. 1 0 0 |
| 3 | 192S R229 | .. 613 .. | .. I 1 20 |
| 4 | 192S3R226 | .. 536 (කොටසක්) | .. 0 1 0 |
| 5 | — | .. 550 (කොටසක්) | .. 0 1 0 |
| 6 | 192S3R220 | .. 278 .. | .. 1 3 1 |
| 7 | — | .. 31C .. | .. 3 0 37 |
| | | ගෙදගල—F. V. P 240. | |
| 8 | 194S3R168 | .. 5D, 45A, 45C | .. 0 1 3 |
| 9 | — | .. 216G (කොටසක්) | .. 1 0 0 |
| 10 | 194S3R130 | .. 273K .. | .. 1 0 27 |
| | | පරගල—F. P. V. 224. | |
| 11 | 194E3R29 | .. 364D .. | .. 18 0 22 |
| 12 | 194S3R176 | .. 357B .. | .. 0 2 0 |
| | | වෙවැල්කඳුර—F. V. P. 245. | |
| 13 | 196S?R7 | .. 2Q, 2T, 2U, 2V, 2R1, 2C | .. 2 3 0 |
| | | කුරුවිටිකෝරලය. | |
| | | මාපෝට—F. V. P. 207. | |
| 14 | 139S1R258 | .. 63 .. | .. 0 2 23 |
| | | දෙසියාගල—V. P. 711. | |
| 15 | — | .. 44 (කොටසක්) | .. 0 1 0 |
| | | කිරිපොරුව—F. V. P. 50. | |
| 16 | 142S1R271 | .. 89AP .. | .. 1 1 26 |
| | | නුගදන්ඩ තහදිකැලේ.—F. V. P. 217. | |
| 17 | 143S1R250 | .. 41 .. | .. 0 2 0 |
| 18 | 143S1R251 | .. 12'H .. | .. 0 2 9 |
| 19 | 143S R261 | .. 114 (කොටසක්) | .. 0 2 0 |
| 20 | 143S1R262 | .. 152 (කොටසක්) | .. 0 2 0 |
| | | හැඩුරන—F. V. P. 53. | |
| 21 | 142S1R99 | .. 118 .. | .. 0 3 2 |
| | | නවදුන්කෝරලය. | |
| | | මොරතොට—F. V. P. 194. | |
| 22 | — | .. 105 .. | .. 2 1 11 |
| | | කරවිට—F. V. P. 39. | |
| 23 | — | .. 121, 122, 124, (කොටස්) | .. 1 0 0 |
| | | බෝපිටිය—F. V. P. 197. | |
| 24 | — | .. 244 (කොටසක්) | .. 0 1 0 |
| | | අටකලන්කෝරලය. | |
| | | කෙම්මන.—F. V. P. 459. | |
| 25 | — | .. 15A .. | .. 0 2 0 |
| | | හොරම්ල.—F. V. P. 612. | |
| 26 | 238S5R24 | .. 48 .. | .. 5 1 9 |

## සුප්‍රිම් උසාවියේ දැන්වීම්.

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශ කරන්නේනම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය මේ 1946ක්වූ මාර්තු මස 20වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අළුත්කඩේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනාමිය ඇත.—එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඈත්. ඒ. ඩබ්ලිව්. ද සිල්වා,
බ. දි. දෙ. පිස්කල් වෙනුව.

මේ 1946ක්වූ පෙබරවාරි මස 26වෙනි දින
කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

---

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශ කරන්නේනම් කළුතර දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය මේ 1946ක්වූ මාර්තු මස 21වෙනි දින පෙරවරු 11 පැය පටන් කළුතර තිබෙන නගරසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත.—එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඈත්. ඒ. ඩබ්ලිව්. ද සිල්වා,
බ. දි. දෙ. පිස්කල් වෙනුව.

මේ 1946ක්වූ පෙබරවාරි මස 25වෙනි දින
කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.